www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ බෝම්බ ප්‍රහාරවලින් දිවි ගලවාගත් අය හා ප්‍රදේශවාසීහු ත්‍රස්ත ප්‍රහාර හෙළාදකිති

Sri Lankan bomb survivors and local residents denounce terror attacks

**අපේ වාර්තාකරුවන් විසිනි**

**2019 අප්‍රේල් 22**

ඊයේ මාරක බෝම්බ පිපිරුම්වලින් දෙකක් සිදු වූ කොළඹ කොච්චිකඩේ හා මීගමුව කටුවාපිටිය ප්‍රදේශවාසීන් සමග *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ)* වාර්තාකරුවෝ කතා කල හ. තුවාල ලබා බේරුනු අය හා අතුරුදන් වුනු තම ඥාතීන් පිලිබඳ තොරතුරු සොයන අය සමග සාකච්ඡා කිරීමට ඔවුහු කොලඹ ජාතික රෝහලට හා මීගමුව දිස්ත්‍රික් රෝහලට ද ගිය හ.

කොච්චිකඩේ සාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිට ජම්පටා වීදියේ ජීවත් වන එන්. ඒ. සුමනපාල මෙසේ කීවේ ය: "උදෑසන යාඥාව ඉවර වෙන්න ඔන්න මෙන්න කියා 8.45ට විතර විශාල පිපිරුමක් ඇති වුනා. මිනිසුන් කෑගසද්දී මස් කැබලි විසිරී තිබුනා. පාස්කු ඉරිද හින්ද පල්ලිය ඇතුලෙ දහස් ගානක් ඉන්න ඇති. පාස්කු මෙහෙයට ඈත ප්‍රදේශවලින් බොහෝ දෙනා ආව.

"ඒ වෙලාවෙ තිබුනෙ එක ඇම්බියුලන්ස් එකයි, ඒක ආවෙත් බෝම්බෙ පුපුරා පැය බාගයක් විතර ගියාට පස්සෙ. බස්, ත්‍රී-රෝද රථ හා ප්‍රදේශවාසීන්ගේ වාහනවලින් රෝගියො රෝහලට අරන් ගියා."

සුමනපාල කෝපයෙන් යුතු ව ත්‍රස්ත ප්‍රහාර හෙලාදැක්කේ ය. "මේ පිපිරීමට වගකිව යුත්තෙ කවුද කියල මම දන්නෙ නැහැ, ඒත් ඒක ම්ලේච්ඡ ක්‍රියාවක්. සෑම දෙනා මත ම විශාල විනාශකාරී බලපෑමක් ඇති කරපු 30-අවුරුදු යුද්ධයක් අපි අත්දැක්කා. මේ බෝම්බ ප්‍රහාරයෙ ඉලක්කය විය හැක්කෙ වර්ගවාදය හා ආරවුල් ජනනය කිරීම යි. ඒක මුලුමනින් හෙලාදැකිය යුතු යි."

සාන්ත අන්තෝනි දේවස්ථානය අසල ම ජීවත් වන ස්ටීවන් ප්‍රනාන්දු මෙසේ කීවේ ය: "මම නිදාගන ඉන්න අතරෙ විශාල පිපිරීමක් හටගත්ත. පිපිරීම සිදු වුනේ පල්ලිය ඇතුලෙ කියල අම්ම කියපු හින්ද මා ඉක්මනින් එතනට ගියා. හැමතැන ම ලේ හා මස් විසිරිලා තිබුන. ඒක හරි වියවුල් සහගත තත්ත්වයක්, මිනිස්සු කෑගගහ දිවුවා." ත්‍රස්තවාදී ප්‍රහාරය "සාමකාමී ව ජීවත් වන මහජනයා අතර ගැටුම් ජනනය කිරීමේ නරුම උත්සාහයක්" ලෙස ප්‍රනාන්දු විසින් හෙලාදැක්කේ ය.

කොච්චිකඩේ පිපිරීමෙන් සුලු තුවාල ලත් 35 දෙනෙකු ප්‍රතිකාර ලබන කොලඹ ජාතික රෝහලේ 32 වාට්ටුවට ඇතුලු වීමට ඉඩ දුන්නේ මාධ්‍යවලට පමනි.

වත්තල සිට පැමිනි 15 හැවිරිදි ශිෂ්‍යයෙක් වන ෂොනාල් ඩැනියෙල්ගේ මුහුනට හා දකුනු අතට තුවාල සිදු වී ඇත. ඔහුගේ පියා *ලෝසවෙඅ* වෙත කීවේ තම පුත්‍රයා උදෑසන දේව මෙහෙය සඳහා කොච්චිකඩේ පල්ලිය වෙත ගියත් ආපසු පැමිනියේ ප්‍රමාද වී බව යි. "ඔහු ප්‍රමාද වුන හින්ද අපි කලබලයට පත් වුනා, ඊට පස්සෙ පල්ලියෙ පිපිරීමක් සිද්ධ වෙලා කියල ආරංචි වුනා ම වහා ම පල්ලියට ගියා. එතෙන්දි දැන ගත්ත ගොඩුරු වෙච්ච අය රෝහලට ගෙනිච්ච කියලා. බොහොම බයෙන් අපි මෙහෙ ආව, ඒත් වාසනාවකට ඔහුට සිද්ද වෙලා තියෙන්නෙ සුලු තුවාල විතරයි. මේ බෝම්බ ප්‍රහාරය ම්ලේච්ඡ අපරාධයක්."

කොලඹ පිටකොටුවේ 42 හැවිරිදි බර උසුලන්නෙකු (නාටාමි) වන රන්ජිත් කුමාර් පිලිස්සුම් සඳහා ප්‍රතිකාර ලබමින් සිටියේය. "මම හිටියෙ පල්ලිය ඇතුලෙ, එක පාරට ම පිපිරීමක් සිද්ද වුනා, ඒත් එක්කම තවත් ලොකු සද්දයක් එක්ක ගිනි ජාලා ඇතිවුනා. මම ඇදගෙන වැටුනා ඒත් පිටතට එන්න පුලුවන් වුනා" යි ඔහු කීවේ ය.

"මගේ බිරිඳ ඇදගෙන වැටුන. ඇයට ඔලුවේ තුවාල තියන නිසා 38 වාට්ටුවට දැම්ම. අවුරුදු 10 ක් වන මගේ පුතාත් පල්ලියෙ ඇතුලෙ හිටියෙ, ඒත් වාසනාවට කෙස් පිච්චිලා විතරයි. අපිට නිශ්චිත මාසික ආදායමක් නැහැ ඒත් දවස ම වැඩ කරල රුපියල් 2,000ක් විතර හොයා ගන්නව. මේ ආදායමෙන් මම හය දෙනෙකුට කන්න දෙන්න ඕන. මේ සිද්දිය අපට එල්ල වෙච්ච ලොකු ප්‍රහාරයක්."

නාවලපිටියේ සිට පැමිනි 32 හැවිරිදි නෙල්සන් ගම්පහ ගෑස් සමාගමක වැඩ කරයි. "බෝම්බය පිපිරීම නිසා ඇදන් වැටුන ම මගේ ඔලුවට තද පාරක් වැදුන, කීප දෙනෙක් මගේ ඇග උඩට වැටුන. පිපිරීමේ විශාල ශබ්දය හින්ද ඒ වෙලාවෙ මාත් එක්ක පල්ලියෙ හිටපු මගේ මාමට දැන් මොනවත් ඇහෙන්නෙ නැහැ. බෝම්බය පුපුරනකොට මෙහෙය දෙමල භාෂාවෙන් සිද්ද කරමින් අපි ඉටි පන්දම් පත්තු කරමින් හිටිය.

"මගේ බිරිඳට බබෙක් හම්බ වුනා විතරයි, එයා දැන් ගෙදර යාමේ අපේක්ෂාවෙන් කොලඹ කාසල් රෝහලේ

ඉන්නව. මම ඉස්පිරිතාලෙ කියල එයා දන්නෙ නැහැ. වාසනාවට මම ජීවත් වෙලා හිටියත් මේක සාහසික ක්‍රියාවක්. මිනිස්සු කොච්චර මැරිල, කී දෙනෙකුට තුවාල වෙලාද කියල බලන්න."

සාන්ත අන්තෝනි දේවස්ථානයේ සිටි තම ස්වාමි පුරුෂයන් දෙදෙනා සොයන තරුන කාන්තාවන් දෙදෙනෙක් රෝහලේ සිටිය හ. ඔවුන්ට ස්වාමි පුරුෂයන් සොයාගත නො හැකි විය. කාන්තාවන් දෙදෙනාගෙ න් අයෙක් වන එස්. රෝහිනී සහල් සාප්පුවක වෙලඳ නියෝජිතයෙකු වන 30 හැවිරිදි ලෝගනාදන් රමේස් සමග විවාහ වී සිටී.

"අපි විවාහ වුනේ අවුරුදු පහකට කලින්, දැන් අපිට අවුරුදු පහක දරුවෙක් ඉන්නව" යි රෝහිනී කීවා ය. "මගේ මහත්තය කොච්චිකඩේ පල්ලියෙ දේව මෙහෙයට ගියා ඒත් මමයි පවුලෙ අනෙක් අයයි වෙනත් පල්ලියකට ගියා. ජාතික රෝහලේ ඔක්කොම වාට්ටුවලටත් අනෙකුත් රෝහල්වලටත් අපි ගියා, ඒත් ඔහු හොයාගන්න බැරි වුනා. අපි මේ ප්‍රහාර දැඩි ලෙස හෙලාදකිනවා" යි ඇය කීවා ය.

තවමත් සිරුරු 20 ක් පමන තිබෙන මීගමුවේ කටුවාපිටිය කතෝලික දේවස්ථානයට ද *ලෝසවෙඅ* වාර්තාකරුවෝ ගිය හ. හඳුනාගත නො හැකි තරමට පිලිස්සී තිබූ සිරුරු විසිරී පස්වරු 2 වන තෙක් එහි තිබුනි. පල්ලිය ඇතුලත ලේ විසිරී තිබුනු අතර පිපිරීම හේතුවෙන් ගොඩනැගිල්ලේ වහලෙහි උලු බිඳී ගොසිනි.

ශෝකාකුල මැදිවියේ පුරුෂයෙකු පල්ලියෙන් පිටතට පැමින මෙසේ කෑගැසී යː "මේ දේවල් සිද්ද වෙනකන් දෙවියො කොහේ ද හිටියෙ? මේක කවුරු කලත්, ඕනෑම එකට එක කිරීමක් සාමාන්‍ය ජනයා මරා දැමීම පමනයි සිද්ද වෙන්නෙ."

බෝම්බයට ගොදුරු වූවන්ගේ ඥාතීන් පල්ලියටත් ඉන්පසු මීගමුව රෝහලටත් වහා ම පැමිනිය හ. රෝගීන් බැලීමට එන අයට පොලීසිය හා අනෙකුත් ආරක්ෂක සේවාවන් දැඩි සීමාකිරීම් පනවා ඇත. රෝහලට ඇතුල් වීමට ඉඩ දෙන්නේ රෝගියාගේ පවුලේ එක් අයෙකුට පමනි.

තුවාල ලත් ඥාතීන් සොයමින් හඬා වැටෙන මිනිසුන් හා ගැහැනුන් විශාල පිරිසක් සිටි අතර ඔවුන්ගෙන් සමහරු පැමින සිටියේ ඈත පලාත් වලිනි. තමන්ගේ නැන්දම්මා පිපිරීමෙන් ඝාතනය වූ එක් අයෙක් මෙසේ කියමින් හඬා වැටුනිː "මගේ පොඩි පුතා ඔලුවෙන් ලේ පෙරාගෙන ගෙදර ආව, මගේ අවුරුදු 15 පුතා හොයාග න්නබැහැ. ඔහු පල්ලියෙ වත් රෝහලේ වත් නැහැ."

මීගමුව රෝහලේ ප්‍රමානවත් ඇඳන් හා වෛද්‍ය කාර්ය මන්ඩලය නොමැති නිසා තුවාල ලත් රෝගීන් බොහෝ දෙනෙකු කොලඹ ජාතික රෝහලට, රාගම ශික්ෂන රෝහලට හා හලාවත තවත් රෝහලකට මාරු කර යැවුනු බව වෛද්‍යවරයෙක් ලෝසවෙඅ ට කීවේ ය.

බරපතල තුවාල ලත් අයට ලේ දීම සඳහා මාධ්‍යවල ආයාචනයට ප්‍රතිචාර දක්වමින් තරුනයන් ඇතුලු බොහෝ දෙනා රෝහලට පැමිනිය හ. ඔවුන්ගෙන් එක් අයෙක් *ලෝසවෙඅ* වෙත මෙසේ තියුනු හඬින් කීවේ යː "මේ ප්‍රහාරෙ කවුරු කලත් ඒකෙ වාසිය ගන්නෙ පාලකයො. මැතිවරන කල් දාන්නත් මහජනයා මත වැඩිදුර බර පටවමින් වර්ජන තහනම් කරන්නත් දේශපාලකයින් මේක ගසාගෙන කයි."

© www.wsws.org